"ගුවන් අනතුරුවලින් මියගොස් යළි ඉපදුණු ගුවන් නියමුවෝ" යන සිරස්තලය සමගින් ඉරිදා ලංකාදීප (ජනවාරි 23, 2022) පුවත්පතේ දැක්වුණු ලිපියක, එක් තැනක "දමිළ ත්‍රස්තවාදීන්" යැයි දක්වා තිබිණි.

ඔබ සිතන ලෙසට,

1) "දමිළ ත්‍රස්තවාදීන්" වැනි යෙදුමක් ඔස්සේ, එක් ජනවර්ගයක් සෘණාත්මකව ඒකාකෘතික කොට දැක්වීමක් (stereotyping) සිදු නොවන්නේ ද?

2) "දමිළ ත්‍රස්තවාදීන්" යනුවෙන් වන පොදු ජනවර්ගයක් ත්‍රස්තවාදීන් ලෙසින් දැක්වෙන්නේ යැයි ගත හැකි යෙදුමක් වෙනුවට, වඩාත් නිශ්චිත කණ්ඩායමක් දැක්වෙන "එල්ටීටීඊ ත්‍රස්තවාදීන්" වැනි යෙදීමක් වඩාත් යෝග්‍ය නොවන්නේ ද?

3) "දමිළ ත්‍රස්තවාදීන්" වෙනුවට "එල්ටීටීඊ ත්‍රස්තවාදීන්" යනුවෙන් යෙදීම ඔස්සේ, පුවතේ එම අදහසට හානියක් හෝ අදහස විකෘති වීමක් සිදු නොවන්නේ නම්, වඩාත් යෝග්‍ය යෙදුම ලෙසින් ඔබ තෝරාගන්නේ කුමක්ද?